ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතය - 2023

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ (මණ්ඩලය) සහ එහි පරිපාලිතය ඇතුළත් සමූහයෙහි (සමූහය) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ හා සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන

1.5.1 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 55 සහ 78 ඡේද අනුව එකතු කළ අගය මත බදු සහ ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බදු මූල්‍ය ප්‍රකාශනවල උප අයිතමයක් ලෙස හෝ සටහන්වල වෙනම විස්තර කිරීම කළයුතු වුවද, එකතු වටිනාකම රු.122,560,183ක් වූ එකතු කළ අගය මත බදු (VAT) සහ ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) මූල්‍ය ප්‍රකාශනවල "වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ" ශේෂය තුළ එක් උප අයිතමයක් ලෙස ඇතුළත් කර තිබුණි.	ජංගම හා ජංගම නොවන වගකීම්වල එකතුවෙන් එකතු කල අගය මත බද්ද හා සමාජ ආරක්ෂණ බද්දෙහි වටිනාකම ප්‍රතිශතාත්මකව සියයට 7 ක් පමණ වේ. මෙය ප්‍රමාණාත්මක අගයක් නොවූ බැවින් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ නිරූපණය කර ඇත. කෙසේ වෙතත් 2025 වර්ෂයේ සිට එය ශේෂ පත්‍රයේ වෙනම නිරූපණය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	ප්‍රමිතිය අනුව එකතු කළ අගය මත බදු සහ ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බදු මූල්‍ය ප්‍රකාශනවල උප අයිතමයක් ලෙස හෝ සටහන්වල වෙනම විස්තර කිරීම කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 103 ,104 හා 105 ඡේද අනුව නිෂ්පාදන කටයුතු වලට අදාල වන පිරිවැය විකුණුම් පිරිවැය යටතේ හඳුනාගත යුතු වුවද ඒ අනුව කටයුතු නොකර මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන යන්ත්‍ර සූත්‍ර සහ වතු උපකරණවල රු.128,326,535 ක් වූ සමස්ථ ක්ෂය වටිනාකම ආයතන හා පරිපාලන වියදම් යටතේ ඇතුළත් කර තිබුණි.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විශාල වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමක් සිදුකරනු නොලබන අතර භාවිතා කරනු ලබන යන්ත්‍ර සූත්‍ර වලද බොහෝ ප්‍රමාණයක කාලය අවසන් වී ඇත. ප්‍රමාණාත්මක වටිනාකමක් නොමැති ප්‍රමාණයක් පමණක් ආයතන හා පරිපාලන වියදම් තුල ඇතුලත්ව ඇත.	ප්‍රමිතිය අනුව නිෂ්පාදන කටයුතු වලට අදාල වන පිරිවැය විකුණුම් පිරිවැය යටතේ හඳුනාගත යුතුය.

(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි 15 හා 16 ඡේද අනුව මණ්ඩලය විසින් තාවකාලිකව අයකළ හැකි බදු වෙනස්කම් සැලකිල්ලට ගෙන සමාලෝචිත වර්ෂය සඳහා විලම්භිත බදු වත්කම් හෝ වගකීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැළපිය යුතු වුව ද එසේ සිදුකර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ සිට මණ්ඩලය විසින් තාවකාලිකව අයකළ හැකි බදු වත්කම් සැලකිල්ලට ගෙන විලම්භිත බදු වත්කම් හෝ වගකීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට අදාල ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමි.	ප්‍රමිතිය අනුව විලම්භිත වත්කම් හා වගකීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 50 හා 51 ඡේද අනුව භාවිතයට ගනු ලබන වත්කම්වල ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඵලදායි ජීවකාලය ඇස්තමේන්තු කර ගිණුම්වල ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් එකතුව රු.423,612,567 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ස්ථාවර වත්කම් මණ්ඩලය විසින් භාවිතා කරමින් පැවතියද ඒවායේ ඵලදායී ජීවකාලය සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ට අනුව භාවිතයට ගනු ලබන වත්කම්වල ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර ඵලදායි ජීවකාලය ඇස්තමේන්තු කළයුතු වුවත් , ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර, පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙම වර්ෂය තුල ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමට නොහැකි විය.	ප්‍රමිතිය අනුව මණ්ඩලය භාවිතා කරමින් පැවති සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය කර ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව පවතින රු. 1,335,382ක් වූ කජු වගාව, රු. 212,765ක් වූ කුරුඳු වගාව සහ රු. 20,409,766ක් වූ රබර් වගාව යනාදී මේරූ ධාරක ජීව විද්‍යාත්මක වගාවන් සඳහා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 16 අනුව සමාලෝචිත වර්ෂයේදී ඊට අදාළ ක්ෂය ගැලපීම් සිදුකර නොතිබුණි.	විගණන වාර්තාව හා එකග වේ. ඉදිරියේදී රබර් වගාව සඳහා අදාළ වන ක්ෂය වියදම හඳුනාගෙන පොත්වලින් ලියාහැරීමට කටයුතු කරමි.	ප්‍රමිතිය අනුව අදාළ ක්ෂය ගැලපීම් සිදුකළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 හි 5.5.15 ඡේදය අනුව වෙළඳ හා වෙනත් ණයගැති ශේෂ සඳහා පසුකාලීන හානිකරණ හඳුනාගැනීම් මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය (Expected Credit Loss Method) භාවිතා කළයුතු වුවත් රු.234,835,927 ක්වූ වෙළඳ හා වෙනත් ණයගැති ශේෂ සඳහා එසේ ගණනය නොකර මූල්‍ය ප්‍රකාශනයන්හි රු.103,324,907ක ප්‍රතිපාදනයක් සිදු කිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට එම වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂ වටිනාකම නිවැරදි බව තහවුරු නොවීය.	විගණන වාර්තාව හා එකඟවන අතර 2025 ගිණුම් වර්ෂයේ සිට අපේක්ෂිත ණය අලාභ ක්‍රමය භාවිතයෙන් අදාළ ගණනය කිරීම් සිදු කිරීමට කටයුතු කරමි.	මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය අනුව වෙළඳ හා වෙනත් ණයගැති ශේෂ සඳහා පසුකාලීන හානිකරණ හඳුනාගැනීම් මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය (Expected Credit Loss Method) භාවිතා කළයුතුය.

(උ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16 හි 81ඡේදයට පටහැනිව පරසන්ගස්වැව සහ ඔයාමඩුව ගොවිපොළ 02ක 2022 අප්‍රේල් 05 සිට 2023 අප්‍රේල් 05 දක්වා බදුදීම මගින් 2022 වර්ෂයේදී ලද රු.22,755,600ක සමස්ථ ආදායම 2022 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දින 94 කට අදාල රු.5,860,346 ක් වූ ආදායම අඩුවෙන් දැක්වුණි.	විගණන වාර්තාව හා එකඟ වේ. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නැවත සිදු නොවීම සඳහා උපචිත පදනම මත කල්බදු, අදායම් ප්‍රකාශනයට ඇතුළත් කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව වර්ෂයට අදාළ බදු ආදායම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය.

1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ ගොවිපොළවල එකම කාර්යය සඳහා භාවිතා කරනු ලබන උපකරණවලින් රු.143,210,749 ක් හා රු.48,964,645 ක් පිළිවෙළින් සියයට 05 සහ සියයට 10 යන අනුපාත යටතේ ක්ෂය කිරීම හේතුවෙන් එම වත්කම්වල සහ අදාළ ක්ෂය වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.	මණ්ඩලයේ දේපළ පිරියත හා උපකරණයන්හි වතු උපකරණ සහ යන්ත්‍ර උපකරණ යටතේ ඒ ඒ අවස්ථාවේ අරමුණ අනුව කාණ්ඩ දෙකක් යටතේ වර්ග කර ඇති නිසා මෙම වෙනස සිදු වී ඇත.	එකම කාර්යය සඳහා භාවිතා කරනු ලබන උපකරණවලට අදාලව නිවැරදිව ක්ෂය අනුපාත පදනම් කරගෙන ක්ෂය ගණනය කර ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ලෙජරය අනුව 2022 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් අවසන් ශේෂය රු.228,769,504 ක් වුවද 2023 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.228,614,106 ක් දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය රු.155,398 කින් අඩුවෙන් දැක්වුණි.	විගණන විමසුම හා එකඟ වේ. ශ්‍රී ලංකා කුකුළු පාලන පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීමේදී එම සමාගමෙන් 2023 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.155,398 ක මුදල අදාළ වටිනාකමින් ආරම්භක ශේෂය අඩුවී ඇත. 2024 ගිණුම් ඉදිරිපත් කිරීමේදී අදාළ වරද නිවැරදි කර ඇත.	ආරම්භක ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් තැන්පතු ගිණුමේ ශේෂය රු.180,000 ක් වුවද බැංකු ශේෂ සනාථනය අනුව එම ශේෂය රු.480,000ක් වූයෙන් මුදල් හා මුදල් සමාන දෑ රු.300,000 කින් අඩුවෙන් දැක්වුණි.	විගණන වාර්තාව හා එකඟ වේ. ධනආයෝජන ගිණුමට අදාළ ආරම්භක ශේෂය QB ගිණුම් පැකේජයට ඇතුලත් කිරීමේදී වැරදීමකින් කිරි පාලන ගිණුමට එම වටිනාකම හරවී ඇත. 2024 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අදාළ වරද නිවැරදි කර ඇත.	නිවැරදිව ගිණුම් ශේෂයන් ගිණුම් පැකේජයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	වැලිසර කිරි ව්‍යාපෘතියට අදාලව වෙළඳ හා අනෙකුත් සාමාන්‍ය තොග යටතේ ඇති 2018 සහ 2019 වර්ෂ වල සිට පැවත එන එකතුව රු.26,492,243ක තොග භෞතිකව නොපැවතුණි.	විගණන වාර්තාව සමඟ එකඟවේ. වැලිසර ගොවිපලේ උපලබ්ධි නොවූ තොග ශේෂය ගිණුම්කරණ පද්ධතිය සහ භෞතිකව ගණනය කළ තොග ශේෂය අතර හටගත් වෙනසක් බැවින් භෞතිකව නොමැත. තවද පැරණි වැලිසර ගොවිපලේ පැවති තොගය පොත්වලින් ඉවත් කිරීමක් සිදු කර නොමැති අතර භෞතික තොග සත්‍යාපනයක් සිදු කර නොමැත.	ගිණුම්කරණ පද්ධතිය සහ භෞතිකව ගණනය කළ තොග ශේෂය අතර හටගත් වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය.
(ඉ)	2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව ගාස්තු මුදල රු.109,873,954ක් වුවද, උපලේඛන හා බදු වාර්තා අනුව එම ශේෂය රු.79,828,695 ක් වුයෙන් රු.30,045,259ක වෙනසක් පැවතුණි.	එකතු කල අගය මත බදු සහ සමාජ ආරක්ෂණ බදු මුදල් රු.122,560,183 ක් ලෙස මූල්‍ය වාර්තා වල ගෙවිය යුතු බද්දක් ලෙස වාර්තා වූ බව පිළිගන්නා අතර හිලව් කල යුතු මුදල් වෙළඳ හා අනෙකුත් ගෙවීම් යටතේ දක්වා ඇති නිසා මෙම වෙනස හටගෙන ඇත. මෙයට අදාල නිවැරදි කිරීම් 2025 වර්ෂයේ සිදු කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.	ගෙවිය යුතු එකතු කළ අගය මත බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ශේෂය තුළ දක්වා ඇති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.3,672,177ක ශේෂය තුළ එකතුව රු.344,031ක්වූ බැර ශේෂ දෙකක් දක්වා තිබීමෙන් ලැබිය යුතු වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.	මෙම ශේෂය වසර ගණනාවකට පෙර පැවත එන ශේෂයක් වන අතර දේශීය අදායම් බදු දෙපාර්තමේන්තුවේ පවතින ශේෂයන් සමඟ සැසඳීම් කර ඉදිරියේදී නිවැරදි කරමි.	ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ශේෂයන් සමඟ සැසඳීම් කර නිවැරදි කළ යුතුය.
(උ)	කණ්දකාඩු ඉඩම් බදුදීම මඟින් සමාලෝචිත වර්ෂයට අදාළ කල්බදු ආදායම රු.9,167,917ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම ආදායම රු.11,580,000 ක් වුයෙන් ආයෝජන ආදායම රු.2,412,083කින් වැඩියෙන් දැක්වුණි.	විගණන වාර්තාව හා එකඟ වේ. මාර්ගගත මුදල් ප්‍රේෂණ කිරීමේ ක්‍රමය හරහා අදාළ කල්බදු මුදල් ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුම වෙත බැරකර තිබෙන අතර එම මුදල් ලබාදීමේදී එම මුදල් කුමන කාල පරිච්ඡේදයට අදාළද යන්න පිළිබඳ එහි සටහන් කර නොමැති වීම නිසා මෙය සිදුවී තිබෙන අතර කල්බදු ගිවිසුම් වලට අදාළ කාල පරිච්ඡේදය සලකා බලා 2024 ගිණුම් ඉදිරිපත් කිරීමේදී අදාළ වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	ඉඩම් බදුදීමේ ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඌ)	වැලිකන්ද ගොවිපලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි සතුන් 211 ක ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම රු.14,907,600 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භෞතික සතුන් ගණන 108 ක් වී තිබුණි. මේ හේතුවෙන් භෞතිකව නොමැති සතුන් 103 ක වටිනාකම වූ රු.7,065,050 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වූයෙන් ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි .	තොග සමීක්ෂණ නිලධාරීන් භාණ්ඩ භෞතිකව පරික්ෂාව දින කිහිපයක් තුල සිදුකිරීම හේතුවෙන් මෙම සතුන් සම්පූර්ණයෙන්ම භෞතිකව ගණනය කළ නොහැක. මෙම ගොවිපලේ සතුන් සම්පූර්ණයෙන්ම ගාලතුල නොසිටින බැවින් භෞතික ගණනය කිරීමේදී අඩුවක් තිබිය හැක. විධිමත් විමර්ශනයකින් තොරව සතුන්ගේ අඩුව පොත්වලින් ලියා හැරීම සිදුකළ නොහැක. මෙම ගැටළුව මත මෙම සතුන් වෙනත් ගොවිපළකට මාරු කිරීම ආරම්භ කර ඇති බැවින් මෙම සතුන්ගේ අඩුවීමක් තිබුණහොත් අදාළ ගැළපීම පොත්වල සිදුකරමි.	ජීව විද්‍යාත්මක වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය
(එ)	අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඔයාමඩුව ගොවිපලට අයත් භූමියේ අතිරේක ආහාර බෝග මෙට්‍රික්ටොන් 150 ක් ගබඩා කළ හැකි ගබඩාවක් ඉදිකර තිබූ අතර එය 2022 ජූලි 07 දින ඔයාමඩුව ගොවිපළ කළමනාකරුට භාර දී තිබුණි. එම ගොඩනැගිල්ල භාරගෙන වසර 3කට අධික කාලයක් ගත වී තිබුණද අදාළ කාල සීමාව තුළ කිසිදු ආර්ථික කටයුත්තක් සඳහා භාවිතයට ගෙන නොතිබුණි. තවද අදාළ ගොඩනැගිල්ලේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමටද කටයුතු කර නොතිබුණි.	විගණන විමසුම හා එකඟ වන අතර 2023/2024 කාලපරිච්ඡේදය මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග සංවර්ධන කටයුතු තාවකාලිකව නවතා තිබූ අතර මෙම ගොවිපලේ මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකළ අතර ඉදිරියේදී මෙම ගොවිපළවල් නිෂ්පාදනය වැඩි කිරීමට සැලසුම් කර ඇති බැවින් එම අවස්ථාවේදී මෙම ගොඩනැගිලිද ගොවිපලේ අවශ්‍යතා සඳහා භාවිතයට ගනු ඇත.	අදාළ ගොඩනැගිල්ලේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.5.1.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විලම්භිත වියදම් ලෙස 2013 වර්ෂයට පෙර සිට පැවත එන රු.16,566,783 ක ශේෂය සම්බන්ධව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ බැවින් නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.	මෙම රු 16,566,783 ක මුදල 2013 වර්ෂයේ සිට විලම්භිත වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති නමුත් 2013 වර්ෂයේ සිට මේ දක්වා විලම්භිත ආදායමක් ජනනය වී නොමැත. එබැවින් මෙම වියදම විමර්ශනයක් කර පොත් වලින් ලියා හැරීමට කටයුතු කරනු ලැබේ.	තොරතුරු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.2. සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 ජුනි මස 18 දිනැති අංක අමප/20/0890/217/052 දරන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපලක් වශයෙන් පවත්වාගෙන යාමට තීරණයක් ගෙන තිබූ අතර ඒ මත ඈවර කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 25 ඡේදය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි ඒ පිළිබඳ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබූ අතර ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ලෙස වෙන් වෙන් වශයෙන් දක්වා තිබුණි.	අදාළ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනයේ 3.1.2.1. යටතේ සිදුකර ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඈවර කිරීමේ කටයුතු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සිදුකළ යුතු හෙළිදරව් කිරීම් ප්‍රමිතිය ප්‍රකාරව සිදුකළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 හි 17 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අනුමත කළ දිනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ දිනය හෙළිදරව් කර නොතිබුණි.	ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සියයට 100 ක් කොටස් අයිතිය ඇති සමාගමක් වන අතර, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය ලබා දුන් අනුමැතිය මූල්‍ය ප්‍රකාශනයේ 2.2 යටතේ හෙළිදරව් කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන අනුමත කළ දිනය හෙළිදරව් කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 හි 5.5.15 ඡේදය අනුව හානිකරණ ගැලපීම් සිදුකළ යුතු වුවත් වසර 5ත් 10ත් අතර හා වසර 10 ඉක්මවූ එකතුව රු.6,610,335 ක් වූ ලැබිය යුතු ශේෂ සඳහා හානිකරණ ගැලපීම් කර නොතිබුණි.	අදාළ හානිකරණ ගැලපීම් 2025 වර්ෂයේ සිට සිදුකිරීමට සැලසුම් කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය අනුව හානිකරණ ගැලපීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	කොළඹ බාන්ස් පෙදෙසේ පිහිටි සමාගමට අයත් පිරිවැය රු.22,500,000 ක් වූ ගොඩනැගිල්ල 2014 ජූලි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා ක්ෂයකර ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු.1,125,000 ක් අඩුවෙන්ද රඳවාගත් ඉපයුම් රු.10,687,500ක් අඩුවෙන්ද දේපළ පිරියත හා උපකරණවල ධාරණ අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි.	විගණන විමසුම හා එකඟ වන අතර, ගොඩනැගිල්ලට අදාළ ක්ෂය කිරීම් සිදුකර 2024 ගිණුම් වලින් නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.	වත්කම් සඳහා වාර්ෂික ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

(ඉ)	ජංගම වත්කම් වැඩිවීම හා ජංගම වගකීම් අඩුවීම පිළිවෙලින් රු.929,810 ක් හා රු.534,409ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී එම ශේෂයන් රු.671,310ක් හා රු.515,912 ක් ලෙස දක්වා තිබුණි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වැරදි නිවැරදි කරන ලදී.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය.

1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු ගිණුම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රධාන කාර්යාලයේ සේවක ණයගැති වටිනාකම වූ රු.757,743 ක මුදල තුළ වසර 05 ඉක්මවූ රු.379,262 ක් වූ ණයගැති ශේෂයක් පැවතුනි. එසේම සේවක ණයගැති වටිනාකමින් රු.636,326 ක් ආයතනයෙන් ඉවත්ව ගොස් ඇති සේවකයින් 12 දෙනකුගෙන් අයකර ගැනීමට පවතින ශේෂ විය.	විගණන වාර්තාව හා එකඟ වේ.	සේවක ණයගැති ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශන අනුව රු.234,257,786ක් වූ ණයගැති ශේෂය තුළ වසර 05 ඉක්ම වූ ණයගැති වටිනාකම රු.79,650,700ක් වූ අතර එම ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. තවද එදිනට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබූ රු.5,821,542ක් වූ ණයගැති වටිනාකමෙන් කිසිදු ණයගැති ශේෂයක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	විගණන වාර්තාව හා එකඟ වේ. අයකර ගත නොහැකි මට්ටමේ පවතින වසර 05 වඩා වැඩි ණයගැති ශේෂ පොත්වලින් ලියා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	ණයගැති ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	"පිබිදෙමු පොළොන්නරුව" ව්‍යාපෘතිය යටතේ පොළොන්නරුව ගොවිපළ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 2016 වර්ෂයේ දරන ලද රු.5,044,043ක් වූ වියදමත් ලැබිය යුතු ශේෂයන් ලෙස දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් එම ශේෂය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ දරන ලද වියදම්වලට අදාළ බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා යොමුකර තිබුණද අදාළ ප්‍රතිපාදන කාලය අවසන්වීම මත නැවත මහා භාණ්ඩාගාරය වෙත හරවා යැවීම නිසා නිසා මෙම මුදල ගෙවීම නතර වී ඇත.	පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබිය යුතු මුදල් අදාල පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය.
(ඈ)	බෝපත්තලාව ගොවිපලේ වැව් පිරිසිදු කිරීම වෙනුවෙන් වසර 10කට පමණ පෙර පෞද්ගලික සමාගමකට ගෙවා තිබූ රු.150,000ක් සමාලෝචිත වර්ෂයේ	බෝපත්තලාව ගොවිපල අදාළ සමාගමට මුදල් ගෙවූ බව තහවුරු කරගැනීමට කිසිදු මූලාශ්‍ර ලේඛනයක් සොයා	මූලාශ්‍ර ලේඛනයක් සොයා ගැනීමට කටයුතු කිරීම සහ අදාල පාර්ශවයන්ගෙන්

	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල පෙර ගෙවීම් ලෙස දක්වා තිබුණ ද මෙම ගෙවීම සම්බන්ධයෙන් කාර්යය ඉටුකළ බවට හෝ මුදල් ගෙවූ බවට මූලාශ්‍ර ලේඛණ නොමැතිවීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් අයකරගැනීමට නොහැකි වී තිබුණි.	ගැනීමට නොහැකිවී ඇති බැවින් අදාළ මුදල් අයකර ගැනීමට නොහැකිව පවතී.	අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු ගිණුම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුල ඇති වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය යටතේ වූ වෙළෙඳ ණයහිමි ශේෂයන්හි කාල විශ්ලේෂණය අනුව වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක සිට පැවත එන එකතුව රු. 132,942,034 ක් සහ වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.57,227,417 ණය ශේෂ පැවතිණි.	මණ්ඩලයේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතු කොටගෙන ණය පියවීම ප්‍රමාද වී තිබෙන අතර මේ වනවිට මෙම ණය මුදල් කොටස් වශයෙන් පියවීම සිදුකරනු ලබයි.	ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම මූල්‍ය ප්‍රකාශනයන්හි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ වශයෙන් එකතුව රු.3,345,629ක් දක්වා තිබුණද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමට ගෙවිය යුතු වශයෙන් කිසිදු වටිනාකමක් පෙන්නුම් කර නොතිබුණි.	2015 වර්ෂයේ දී ජාතික පශු සම්පත් මණ්ඩලයට හා ගොවිපළවල් සදහා රු.4,089,480 ක් වටිනා මීගවයන් හා එළ ගවයන් ද , රු.982,440 ක්වූ ගෘහ භාණ්ඩ ලබා දී ඇති අතර, එහි මුළු වටිනාකම රු.5,071,920 ක් වේ. එම මුදලින් අඩු කර ගැනීම සඳහා 2019 හා 2020 වර්ෂ වලදී රු.1,245,785 ක් වටිනා මීගවයන් මණ්ඩලයෙන් සමාගමට ලබා දෙන ලදී. මීට අමතරව 2020 හා 2021 වර්ෂවලදී ආයතන දෙක අතර වූ සාමාන්‍ය ගණුදෙනු මෙම ලැබිය යුතු මුදලෙන් අඩු කර ඇති බැවින් ලැබිය යුතු ඉතිරි ශේෂය ලෙස රු.3,345,629 ක් සමාගමේ ගිණුම් තුල පෙන්වා ඇත. මෙම ඉතිරි මුදල ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමත් සමග නිරවුල් කළ හැකි බව දන්වා සිටිමි.	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සමාගමෙන් ලැබිය යුතු ශේෂ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශනයේ මණ්ඩලයට ගෙවිය යුතු වටිනාකම අතර වෙනස්කම් සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය.

(ඇ)	මණ්ඩලය විසින් 1993 වර්ෂයේ සිට අනුගමනය කරන ලද ගිණුම්කරණ මාර්ගෝපදේශය අනුව ගොවිපොළෙහි මුදල් හැසිරවීම වෙනුවෙන් එම කටයුතු හා සම්බන්ධ නිළධාරීන්ට මුදල් ප්‍රමාණයෙන් සියයට 0.75ක කොමිස් මුදලක් ගෙවීම් කිරීමට තිරණය කර තිබුණද එම ගිණුම්කරණ මාර්ගෝපදේශය සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි. 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (Trade and Other Payable) යටතේ දක්වා ඇති රු.48,891,243ක් වූ සේවක ණයහිමි (Staff Creditors) ශේෂය තුළ ගොවි සේවකයන් සඳහා ගෙවිය යුතු කොමිස් මුදල් (Cash Commission) රු.12,051,665ක් ඇතුලත්ව තිබූ බව නිරීක්ෂණය විය.	ගිණුම්කරණ මාර්ගෝපදේශයන් 1993 සිට මණ්ඩලයේ ක්‍රියාත්මක වන අතර මේ සඳහා අනුමැතිය ලබාගත්තේද නැද්ද යන්න සොයාගැනීමට නොහැකි වී ඇත්තේ මෙය වසර 32 කට පෙර සිදු වී ඇති බැවිනි.	මුදල් හැසිරවීම වෙනුවෙන් එම කටයුතු හා සම්බන්ධ නිළධාරීන්ට කොමිස් මුදලක් ගෙවීම් කරන්නේ නම් ඒ සඳහා අනුමැතිය ලබාගත යුතුය.
(ඈ)	2004 සහ 2005 වර්ෂවල මහ කන්නයේ බඩ ඉරිඟු අස්වනු මිලදී ගැනීම සඳහා ගොවීන්ගේ භාරකාරත්ව අරමුදල මගින් ලබා ගත් රු. 102,662,700 ක් වූ ණය මුදල වෙනුවෙන් 2012 වර්ෂය දක්වා රු.98,023,448 ක් වූ උපචිත ණය පොළිය ජංගම වගකීම්වල වෙන්කිරීම් යටතේ දක්වා තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම පොළිය ගෙවීමට කටයුතු කර නොතිබුණි	ගොවීන්ගේ භාරකාරීත්ව අරමුදලෙන් ලබාගත් ණය මුදලට අදාළ පොළිය ගෙවීම සම්බන්ධයෙන් කිසිදු එකඟත්වයකට මේ වන විට පැමිණ නොමැති බැවින් එම මුදල ගෙවිය යුතු ණය පොළි ගිණුමේ සටහන් කර තිබෙන අතර ලබාගත් ණය මුදල පමණක් මණ්ඩලයේ පවතින දුෂ්කරතා හේතුකොට මාසිකව රු.500,000 වාරික වශයෙන් ගෙවමින් පවතී.	උපචිත ණය පොළිය පිළිබඳ එකඟතාවයක් ඇති කර ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	2012 වර්ෂයේ දී සී/ස ලිබියානු කෘෂිකාර්මික සහ පශු සම්පත් පුද්ගලික සමාගමේ සම්පූර්ණ කොටස් අයිතිය ලබාගෙන මණ්ඩලයේ පරිපාලිත ආයතනයක් වන ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම පිහිටුවා තිබූ අතර සී/ස ලිබියානු කෘෂිකාර්මික සහ පශු සම්පත් පුද්ගලික සමාගමේ කොටස්කරුවන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ වියදම, ගුවන් ගමන් ගාස්තු සහ සංයුක්ත දීමනා සඳහා රු.4,201,333ක් ගෙවිය යුතුව තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම	මෙම මුදල සී/ස ලිබියානු කෘෂිකාර්මික සහ පශු සම්පත් පුද්ගලික සමාගම වෙනුවෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ලිබියානු විදේශ ආයෝජන සමාගම වෙත බැංකු අණකරයක් මගින් ගෙවීම්කර ඇති මුදලකි. අදාළ ලිබියානු විදේශ ආයෝජන සමාගම එම බැංකු අණකරය නිෂ්කාශනය කරගෙන නොමැති බැවින් ලංකා බැංකුව අදාළ බැංකු අණකරයේ වටිනාකම	මෙම ශේෂය ගෙවීමේ හැකියාව, අවශ්‍යතාවය ආදිය පිළිබඳ කමිටුවක් මගින් පරික්ෂා කර නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ හැකි බව.

	ගෙවිය යුතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගිණුමට බැරකර ඇත.	
(ඊ)	2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව සීමාසහිත කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමෙන් ලැබිය යුතු ශේෂ ලෙස රු. 4,218,655ක ශේෂයක් පෙන්නුම් කළද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු ශේෂය වශයෙන් එකතුව රු. 2,591,558ක් පමණක් දක්වා තිබීම හේතුවෙන් රු. 1,627,097ක් වූ දිගුකාලීනව පැවත එන මෙම වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	සීමා සහිත කුකුළු පාලන පුද්ගලික සමාගම සහ මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම යන සමාගම් දෙකෙහි ගනුදෙනු වල ඇතිවූ නොඑකඟතාවයන් මත මෙම වෙනස ජනනය වී ඇති අතර මෙම සමාගම් අමාත්‍යමණ්ඩල තීරණය අනුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කරන අතර එහිදී මෙම ගිණුම් වල පවතින දෝෂයන් නිවැරදි වනු ඇත.	උපලේඛණ සහ මූල්‍ය ප්‍රකාශන අතර පවතින වෙනස්කම් හඳුනාගෙන ශේෂයන් නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික පනතේ 2 වන වගන්තිය හා 1975 පෙබරවාරි 14 දිනැති අංක 157 දරන ගැසට් පත්‍රය	මණ්ඩලය විසින් ඉටු කළ යුතු කාර්යයන්ට අදාළ නොවන කටයුතු සඳහා මහබෙරියතැන්න පිහිටි අක්කර 517ක් හා පර්චස් 14 ක ඉඩමක් රු.29,418,300 ක ප්‍රතිෂ්ඨාවකට වසර 99කට හා වැලිසර පිහිටි අක්කර 03 පර්චස් 0.31ක ඉඩමක් රු.31,600,800 ක ප්‍රතිෂ්ඨාවකට වසර 30 කට පෞද්ගලික සමාගම් දෙකකට බදු දී තිබුණි.	1992 ඔක්තෝබර් 28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අනුව විදේශ ආයෝජන පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කාරක සභාවේ සභාපති වශයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් 1992.10.05 දිනැතිව "වික්ටෝරියා ගොල්ෆ් හා ව්‍යාපෘතියට ඉඩම් වෙන්කිරිම " යන මැයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල අංක අමප/1192/145 (5) දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මහබෙරියතැන්න ගොවිපලෙන් අක්කර 517 ක් 1996 සිට වසර 99 දක්වා රජවැල්ල හෝල්ඩින්ස් ආයතනය වෙත බදු පදනම මත නිදහස් කර ඇත.	මණ්ඩලය සතු ඉඩම් බදු දීමේදී පනත හා ගැසට් පත්‍රය මගින් හඳුනාගෙන ඇති මණ්ඩලය විසින් ඉටු කළ යුතු කාර්යයන්ට අදාළ වන, කටයුතු සඳහා පමණක් ලබාදිය යුතුය.

(ආ)	1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ 5(1) වගන්තිය	සේවයෙන් ඉවත් වී දින 30ක් ඇතුළත පාරිතෝෂිත ගෙවා අවසන් කළ වුවත් 2004-2022 කාලය තුළ සේවයෙන් ඉවත් වූ සේවකයන් 25 දෙනෙකු සඳහා රු. 2,226,774 ක් සහ 2023 වර්ෂයේදී සේවයෙන් ඉවත් වූ සේවකයන් 61 දෙනෙකු සඳහා රු. 12,672,254 ක් ද ඇතුළුව එකතුව රු. 14,899,028 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවිය යුතුව තිබුණි.	2023 වර්ෂය වෙනුවෙන් පමණක් ගෙවිය යුතු පාරිතෝෂිත මුදල රු.13,878,089 ක් වන අතර 1993 සිට 2007 දක්වා කාල දීමාව තුල සේවය හැර ගිය වෙක්රෝල් සේවකයන් 15 දෙනෙකුගේ වටිනාකම වන රු.1,020,939 ක මුදල වෙනම ගිණුම්වල නිරූපණය කර ඇත. තවද සේවකයන් සේවයෙන් ඉවත් වී දින 30 ක් ඇතුලත පාරිතෝෂික ගෙවීමට කටයුතු කරන අතර ඇතැම් ලේඛණවල පවතින අඩුපාඩු හේතුවෙන් දින කිහිපයකින් ප්‍රමාදවීමක් සිදුවිය හැකි බව දන්වමි.	පනත ප්‍රකාරව නියමිත දිනවලදී පාරිතෝෂික දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශයේ 6.6 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් දින 607 ක ප්‍රමාදයක් සහිතව 2025 ඔක්තෝබර් 27 දින ද, ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම විසින් දින 652 ක ප්‍රමාදයක් සහිතව 2025 දෙසැම්බර් 12 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.	මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් තිබූ බව පිළිගන්නා අතර මේ වනවිට එම ප්‍රමාදය අවම කර ගනිමින් සිටි. 2026 වර්ෂය තුළ 2024 සහ 2025 මූල්‍ය වාර්තා ලබාදීමත් සමග මෙම ප්‍රමාදය නිම වනු ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නියමිත දිනවලදී මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (2006 අංක 08 දරන එකතු කළ අගය මත බදු මගින් සංශෝධිත) පනතේ 26(i) වගන්තිය	කාලසීමාවට අදාල බදු, ඊට පසු එළඹෙන මාසයේ විසිවන දින හෝ ඊට පෙර ගෙවිය යුතු වුවද 2023 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාලසීමාවට අදාළ මණ්ඩලයේ රු.63,751,460ක් වූ බදු වගකීම 2025 අප්‍රේල් 30	මණ්ඩලයේ පැවති දැඩි මූල්‍ය අර්බුදය හේතුකොටගෙන මෙම බදු මුදල් ගෙවීමේ හැකියාවක් නොතිබූ බව පිළිගන්නා අතර හිඟ බදු මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබාදීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර 2025 අගෝස්තු මාසයේ	හිඟ බදු මුදල් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත කටයුතු කළ යුතු අතර බදු මුදල හිඟයකින් තොරව නියමිත දිනයට ගෙවීමට කටයුතු කළ යුතුය.

		දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.	සිට අදාල බදු මුදල හිඟයකින් තොරව අදාල දිනයට ගෙවන බවට දන්වා සිටිමි.	
(ඉ)	2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 01 සහ 17 (i) වගන්ති.	2022 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලට අදාළව ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බදු රු.7,462,429ක් සහ 2023 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාළව ගෙවිය යුතු රු.8,614,805ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි.	මණ්ඩලයේ පැවති දැඩි මූල්‍ය අර්බුදය හේතුකොටගෙන මෙම බදු මුදල් ගෙවීමේ හැකියාවක් නොතිබූ බව පිළිගන්නා අතර හිඟ බදු මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබාදීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර 2025 අගෝස්තු මාසයේ සිට අදාල බදු මුදල හිඟයකින් තොරව අදාල දිනයට ගෙවන බවට දන්වා සිටිමි.	හිඟ බදු මුදල් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත කටයුතු කළ යුතු අතර බදු මුදල හිඟයකින් තොරව නියමිත දිනයට ගෙවීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හා එහි පරිපාලිතයෙහි මෙහෙයුම් ප්‍රතිඵලය රු. 126,380,488 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.148,554,214 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.274,934,702 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ජීව විද්‍යාත්මක වත්කම්වල අගයෙහි වෙනස්වීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.266,875,590 කින් අඩුවීමත් ,පරිපාලන, බෙදාහැරීමේ සහ අනෙකුත් වියදම් වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හා එහි පරිපාලිතයෙහි සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 02 කින් වර්ධනය වී තිබුණ ද ජීව විද්‍යාත්මක වත්කම් හි සාධාරණ අගය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 63 කින් අඩු වී තිබීම හේතුවෙන් මණ්ඩලයේ හා එහි පරිපාලිතයෙහි දළ ලාභය සියයට 13කින් පිරිහී තිබුණි. තවද බෙදාහැරීමේ වියදම් සියයට 56ක්, පරිපාලන වියදම් සියයට 07 ක්, සහ අනෙකුත් වියදම් සියයට 54 කින් වර්ධනය වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හා එහි පරිපාලිතයෙහි ජංගම වත්කම් අනුපාතය, ක්ෂණික වත්කම් අනුපාතය, දළ ලාභ අනුපාතය පිළිවෙලින් 1:1.24 ක් 0.72 ක් සහ සියයට 25.5 ක් වූ අතර පෙර වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් 1:1.35 ක් 0.74ක් සහ සියයට 28.23ක් විය. ඒ අනුව ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතයෙහි සුළු පිරිහීමක් නිරීක්ෂණය වන අතර කාරක ප්‍රාග්ධන ගැටළුවකට මුහුණ පා ඇති බව නිරීක්ෂණය විය. තවද දළ ලාභ අනුපාතය සියයට 13කින් පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබුණි. එයට හේතු ලෙස සමාලොචිත වර්ෂයේ විකුණුම් සියයට 02 කින් වර්ධනය වී තිබුණ ද, ජීව විද්‍යාත්මක වත්කම් හි සාධාරණ අගය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 63 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව පිරිවැය රු.11,746,756 ක් වූ හෙක්ටයාර 890.71ක ඉඩම් ඔයාමඩුව ගොවිපළ සතුව පැවතුණද ගොවිපළ තුළ එළ ගවයන් 209 ක් පවත්වාගෙනයාම හැර එම ඉඩම් වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. ගොවිපළ සතු ඉඩම් වලින් අක්කර 826 ක් පුද්ගලික සමාගමකට 2022 වර්ෂයේදී බදු පදනමට ලබා දී තිබුණද 2023 අප්‍රේල් 05 දිනෙන් අදාළ බදු කාල සීමාව අවසන්වීමෙන් පසු නැවත බදුදීම හෝ වෙනත් ආර්ථික කටයුත්තකට යොදාගෙන නොතිබුණි.	මෙම ගොවිපළ සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව නොමැති අතර ඉදිරියේදී පෞද්ගලික අංශය හා ඒකාබද්ධව මෙම ගොවිපළ සංවර්ධනයට කටයුතු සැලසුම් කර ඇත. එහිදී මෙයින් ජාතික ආර්ථිකයට වැදගත් කාර්යයක් සිදුවනු ඇත.	ගොවිපළ සතු ඉඩම් මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීම සඳහා ඵලදායි ලෙස යොදාගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මිරිස්වත්ත ගොවිපොළෙහි 2022 සැප්තැම්බර් 7 සහ 8 යන දිනවලදී සිදුවූ අභිජනන කුකුළන් 1,726 ක අස්ථානගතවීම හේතුවෙන් ඇතිවූ රු.5,351,366 ක් වූ සම්පත් හිඟය ඇතුළුව 2023 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.5,536,409 කට අදාළ වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීම ප්‍රමාදවීම හේතුවෙන් විගණිත දිනය වූ 2025 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ මුදල් අයකරගැනීමට නොහැකි වී තිබුණි.	මේ සම්බන්ධයෙන් මණ්ඩලය මගින් විමර්ශනයක් සිදුකරන ලද අතර පොලිසියේ පැමිණිල්ලක් විභාගවෙමින් පවතී. අවශ්‍ය කටයුතු අවසන් වූ වහාම අදාළ පුද්ගලයන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි.	විධිමත් පරීක්ෂණ පවත්වා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2020 ජූනි මස 18 දිනැති අංක අමප/20/0890/217/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට පවරාගැනීමට දී ඇති අනුමැතිය මත 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව කොටස් හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමකට 2021 ජූලි 16 දින ඈවරකරුවෙකු පත්කර 2023 අප්‍රේල් 26 වන දින රු.117,400 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණ ද විසුරුවාහැරීම සිදුනොවීම හේතුවෙන් එම වියදම අනාර්ථික වී තිබුණි. දෙවනුව ණය හිමියන්ගේ කැමැත්ත මත සමාගම ඈවර කිරීමට තීරණය කර සමාගමේ ප්‍රධාන ණයහිමියා විසින් යෝජනා කරන ලද	මෙම සමාගම අධ්‍යක්ෂක මණ්ඩලයේ කැමැත්ත මත විසුරුවා හැරීමට අදාල ලිපිලේඛන සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී, එම සමාගමේ ලේකම් වරුන්ගෙන් අතින් සිදුවී ඇති තාක්ෂණික දෝෂයක් හේතුවෙන් නැවත ණයහිමියන්ගෙන් විසුරුවා හැරීමට පරිවර්තනය විය. ඒ අනුව ප්‍රධාන ණයකරුවෙක් වන ගෝල්ඩ් කොයින් (පුද්) සමාගම මෙම විසුරුවා හැරීමට විරුද්ධවීම නිසා	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම, මණ්ඩලයට පවරාගැනීමට තව දුරටත් ප්‍රමාදයකින් තොරව කටයුතු කළ යුතුය.

	ඇවරකරු සඳහා දැරීමට සිදුවන වියදම විශාල ලෙස වැඩිවීම හේතුවෙන් සමාගමේ ප්‍රධාන ණයහිමියාට 2024 ජුනි 30 දිනට ගෙවිය යුතු රු.13,869,511 ක මුදල ගෙවා ඇවර කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යාමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ණයහිමි සමාගම සමග එකඟ වී තිබුණද 2026 ජනවාරි 05 දින වන විටත් ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	මෙම ක්‍රියාවලිය පමා විය. ප්‍රධාන ණයකරුවා වන ගෝල්ඩ් කොයින් ෆීඩ් මිල්ස් ලංකා ලිමිටඩ් වෙත 2025 සැප්තැම්බර් මස 19 දින ලිපියක් මගින් ගෙවීමට ඇති රු.13,169,511 ක මුදල සඳහා සියයට 10 වට්ටමක් ඉල්ලා ඇති අතර මේ වන විට ඔවුන් එකඟතාවය පල කර ඇත. එම ණය ගෙවා අවසන් වූ පසු ඇවර කිරීමේ කටයුතු ආරම්භ කළ හැකිය.	
(ඈ)	මණ්ඩලයට අයත් වැලිකන්ද ගොවිපළේ සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි ස්ථාවර වත්කම් අයිතම වර්ග 57 ක ඌණතාවය තොග ඒකක 120 ක් විය. 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුවද මෙම වත්කම් අයිතම වර්ගවල තොග ඌණතාවයන් ද පැවතුනි. එසේ වුවද ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන ශේෂයන් ඉදිරියට ගෙනවිත් තිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් දැනටමත් උපදෙස් ලබා දී ඇත.	වත්කම් ඌණතාවය පිළිබඳ විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 ට පැවති රු. 52,521,680 ක බැංකු අයිරාව සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.60,203,743ක් වීම හේතුවෙන් බැංකු අයිරාව සියයට 14 කින් වර්ධනය තිබුණි.	මණ්ඩලය රාජ්‍ය බැංකුවකින් ලබාදී තිබෙන බැංකු අයිරා පහසුකම වැඩිකරගෙන නොමැති අතර අයිරා පහසුකම ඉක්මවා ගොස් නැත. නමුත් මුදල්පොතේ ශේෂය තුල නිකුත්කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්ද ඇතුලත්ව තිබීම නිසා අයිරා පහසුකම ඉක්මවා මුදල් පොතේ ශේෂය වැඩි වී ඇත.	බැංකු අයිරාව පහළ මට්ටමකට පවත්වා ගැනීම සඳහා කටයුතු කළ යුතුය.
(ඊ)	වැලිකන්ද ගොවිපොළෙහි රු.619,485 ක් වූ මුදල් හිඟතාවයක් හා රු.10,287,510ක් වූ ජීව විද්‍යාත්මක වත්කම් හිඟතාවයක් ලෙස එකතුව රු.10,906,995ක් අයකරගැනීම සම්බන්ධයෙන් වංචා විමර්ශන අංශයේ පැමිණිල්ලක් විභාග වෙමින් පවතින අතර 2026 ජනවාරි 31 දිනය වන විටත් එහි කටයුතු අවසන් වී නොතිබුණි.	මේ සම්බන්ධ වංචා විමර්ශන අංශයේ පැමිණිල්ලක් විභාග වන අතර වගකිව යුත්තන් මේ වනතෙක් නිශ්චිතව හඳුනාගෙන නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇත. වංචා විමර්ශන අංශයේ අදාල කාර්යභාරය අවසන් වූ පසු එහි නියමයන්ට අනුකූලව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.	මුදල් හා ජීව විද්‍යාත්මක වත්කම් හිඟතාවයක් පිළිබඳ විමර්ශනය කර අදාල මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයට අයත් ගොවිපළවල කිරි ගවයින් හා මී ගවයින් ප්‍රමාණය 2021, 2022 හා 2023 වර්ෂයන්ට අදාළව පිළිවෙළින් 11,760 ක් 10,503 ක් හා 9,854 ක් ලෙස අඩු වී තිබුණ ද එම සතුන්ට ලබා දෙනු ලබන ආහාර සඳහා දරන ලද වියදම පිළිවෙළින් රු.862,707,615 ක් රු.949,560,850 ක් හා රු. 960,698,128 ක් ලෙස වර්ධනය වී තිබුණි. තවද අදාළ කාල සීමාව තුළ ලබාගෙන තිබූ කිරි ප්‍රමාණය පිළිවෙළින් ලීටර් 10,331,358 ක් ලීටර් 7,062,151ක් හා ලීටර් 5,552,868 ක් ලෙස ක්‍රමයෙන් අඩු වී තිබුණි.	මෙම කිරි අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ රිදියගම ගොවිපලේ කිරි නිෂ්පාදනය සීඝ්‍ර ලෙස පහත වැටීම හා මෙම වර්ෂවල සත්ත්ව ආහාර වල මිල ගණන් ද අඛණ්ඩව ඉහළ යාම වේ. මෙම වර්ෂවල සාන්ද්‍ර ආහාර වල මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ යාම මෙම සත්ත්ව ආහාරවල මිල ගණන් ඉහළ යාමට ප්‍රධාන හේතුව විය.	ආයතනය සතුව පවතින සම්පත් ඵලදායි ලෙස උපයෝජනය කරමින් ගුණාත්මක සත්ත්ව ආහාර නිෂ්පාදනය කර සතුන්ට ලබා දී කිරි ඵලදාව වැඩිකරගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023 වර්ෂයේ දී මණ්ඩලයේ ගොවිපොළ මඟින් ක්‍රියාත්මක කළ එළගව සහ මී ගව, ඌරන්, බැටළුවන්, එළුවන්, සාම්ප්‍රදායික නොවන සතුන් ඇතිකිරීම සහ අල වගාව යන ප්‍රධාන ව්‍යාපෘති මඟින් එකතුව රු.1,919,670,505 ක ආදායම් උපයා තිබුණ ද ඒ සඳහා විකුණුම් පිරිවැය එකතුව රු.1,932,546,548ක් වූයෙන් අදාල ව්‍යාපෘති මඟින් රු. 12,876,043 ක අලාභයක් ලබා තිබුණි.	විගණන වාර්තාවේ සඳහන් එළගව සහ මීගව, සූකර, බැටළුවන්, එළුවන් සහ අර්තාපල් ව්‍යාපෘතියේ එකතුව මුළු ආදායම, විකුණුම් පිරිවැය හ දළ අලාභය නිවැරදි වේ.	ආයතනයේ අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නංවා ආයෝජනයට සාපේක්ෂව උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2025 ඔක්තොම්බර් 27 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර 2025 නොවැම්බර් 26-30 කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට බල පෑ දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ අහිතකර බලපෑම හේතුවෙන් මණ්ඩලයට අයත් ගොවිපළ 24 ක සතුන් 418 දෙනෙකු, ගොවිපළ 12 ක පොල් ගස් 1490 ක් ඇතුළු වෙනත් ගස් වර්ග කෙසෙල්, බඩ ඉරිඟු වැනි කෙටිකාලීන වගාවන් සහ ගොඩනැගිලි හා මාර්ග ඇතුළු ස්ථාවර වත්කම්වලට හානි සිදු වී තිබුණි.	2025 වර්ෂයේ සිදුවූ දිට්වා සුළි කුණාටුවේ හානිය 2025 මූල්‍ය වාර්තාවල අදාල ලියා හැරීම් සිදු කිරීමට නියමිතය.	ආයතනය හා ගොවිපොළ ආශ්‍රිත ආපදා කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාවට නැංවීම සහ හානිය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශවල ගැලපුම් කළ යුතුය.